## සැබෑ ජනතා ලේඛකයා

# ඔරුවල බන්දු



**මෑ**ත යුගයේ අප රටේ පහළ වූ මානව හිතවාදී සැබෑ ජනතා ලේඛකයෙකු කවියෙකු හා සාහිත්‍යධරයෙකු ගුරුවරයෙකු ලෙස අප රටෙහි බහුමානයට පාත්‍රවුණු ඔරුවල බන්දු මහතා පසුගිය නොවැම්බර් 18 වන දින අභාවප්‍රාප්ත වීය. මියෙන විට ඔහුගේ වයස 76 කි.

බන්දු බොහෝ දෙනා හඳුනන්නට වූයේ හැට ගණන් වල රුසියාවේ සිට ලංකාවට ආවාට පසුවය. සෝවියට් රුසියාවේ ඉගෙනුම ලබන්නට ශිෂ්‍යත්ව ලබා රුසියාවේ ලුමුම්බා සරසවියට ලංකාවෙන් ගිය ප්‍රථම ශිෂ්‍ය කණ්ඩායමට ඔහු අයත් විය. ඔහු සමග ඒ කණ්ඩායමේ සිටි තවත් ශිෂ්‍යයෙකු නම් පසු කලෙක ජවිපෙ නායකයා වූ රෝහණ විජේවීරය.

රුසියාවට ගිය එකල ලාංකික බොහෝ තරුණයෝ රුසියන් බස එහිදී ප්‍රගුණ කළහ රුසියානු සාහිත්‍යය මෙන්ම මාක්ස් වාදයද හොඳින් හැදෑරූහ ඔවුන්ගේ සිත් තුළට විප්ලවය යන වචනය සුන්දරත්වයකින් යුතුව පිවිසීම එනිසා පුදුමයක් නොවේ. ඒ ශිෂ්‍යයෝ බොහෝ දෙන සාමාන්‍ය පවුල්වල අය මිස ධනවත්තු නොවූහ.

බන්දුගේ ගම ඔරුවලය. ඔහුගේ සැබෑ නම මා අසා ඇති පරිදි බන්දුරත්න විමලසිරි සේනාධීරය. ඒ නම කෙටි කරමින් ඔරුවල බන්දු යන නම ඔහුට තබන ලද්දේ අභාවප්‍රාප්ත සිළුමිණ කර්තෘ මීමන ප්‍රේමතිලක මහතා යයි කියති. ඒ බන්දු රුසියාවේ සිට සිළුමිණට ලිපි සැපයූ කාලයේය. බන්දු රුසියාවේ සිට පැමිණි මුල් කාලයේ රුසියානු සාහිත්‍යය, එහි ගැමි සුන්දරත්වය හා කම්කරු දිවිපෙවෙත අනාවරණය කරමින් නොයෙත් ගද්‍ය පද්‍ය නිර්මාණය කළේය. රුසියන් බස මෙන්ම මාක්ස්වාදය ඉහළට හදාරා සිටි ඔහු එහෙත් කිසි විටෙක රාජ්‍යයන් පෙරලන විප්ලව කරන්නට කතා කළේ නැත. ඔහු ලියූ කවි බොහොමයක් පළවූයේ එකල ඇත්ත පත්‍රයේය.

ලුමුම්බා සරසවියෙන් උපාධියක්ද ලබා පෙරළා ලංකාවට ආ පසු බන්දු කොළඹ නාලන්දා විදුහලේ රුසියානු බස උගන් වන ගුරුවරයා වීය. ඒ බස පාසැල් මට්ටමෙන් උගන් වන්නට ගිය ප්‍රථම ගුරුවරයා ඔහු විය හැකි ය.

බන්දුගේ ප්‍රථම නවකතාවේ නම - පස් අවුරුද්දය. එය හැටේ දශකයේ ඔහුගේ රුසියානු අත්දැකීම් මත ලියූවකි. එයට ලැබුණු පාඨක ප්‍රතිචාරය ඉමහත්ය. සෝවියට් සිර මැදිරියේ සිට යනු තවත් ඉහළ ගණයේ ඔහුගේ ප්‍රබන්ධයකි. එහි පිළිබඹු වන්නේ සෝවියට් රුසියාවේ වැටීමයි. බන්දු ද යම් දිනක සෝවියට් දේශයේ වැටීම සිදුවේයයි කල් තියාම දැන සිටි කීප දෙනාගෙන් කෙනෙක් යයි කිවහැකිය. ඔහුගේ දේශපාලන දැක්මේ හා දැනීමේ මුවහත්කම ඉන් පැහැදිලි වේ.

ඔරුවල බන්දු ගත කළේ සැබෑ ගැමියෙකුගේ අල්පේච්ඡ ජීවිතයකි. පුහු ආටෝප ගති කිසිවක් යාන්තමටවත් ඔහු මත ගැවිලාවත් තිබුණේ නැත. ඔහු ගමන් ගත්තේ බයිසිකලයේ හෝ සාමාන්‍ය සෙනග පැටවූ තදබද බස්එකකය. ඇන්දේ රෙද්ද හා සාමාන්‍ය කමිසයක්ය. එහෙත් ඔහුගේ දැනුම හා බහුශ්‍රැතකම ඉතා විශාලය. බොරු ආටෝප ජීවිතයක් මවා පා ඒ ඥාණය හැල්ලුකරගන්නට ඔහු සිතුවේ නැත.

සැබෑ දේශප්‍රේමියෙකු වූ ඔහු කොටි ත්‍රස්තවාදයට එරෙහිව පැන එසවූ ලේඛකයෙකි. මියෙන තුරාම බොහෝ කාලයක් තිස්සේ ඉරිදා දිවයිනට ඔහු ලියූ **ජනතා කවිකොළය** නම් කවිපෙළ තම දේශයේ ජනතාව නිවැරදි කිරීමේ අදහසින් දූෂණයට භීෂණයට හා වැරදි දේශපාලනයට එරෙහිව නැගූ දැවැන්ත හඬක් වූයේය.

බොහෝ දෙනාගේ අදහස ඔරුවල කියන ගම වඩාත් ප්‍රසිද්ධියට පත්වුණේ ඔරුවල වානේ කම්හල සහ ඔරුවල බන්දු යන නම් නිසාය යන්නය. එය බොරුවක් යයි කියන්නට බැරිය.

ඔරුවල බන්දු ලේඛකයාණන්ගේ අවසන් කටයුතු වැඩි ගුණ වැයුම් දීර්ඝ කථා ආදියෙන් තොරව ඉතා චාම් අන්දමින් ඔහුගේ ගමේදී සිදුවිය. එසේම ඔහුගේ ඉල්ලීම පරිදි පවුලේ අය විසින් ඔහුගේ මෘත ශරීරය රාගම රෝහලේ වෛද්‍ය අංශයට බාර දෙන ලදී.

ඔරුවල බන්දු මහතාට නිවන් සුව අත්වේවා!

♦ **විස්කම් සෙනෙවිරත්න**
**යක්කල** Sri Lanka


## 5 වෙනි වසර සිහිකිරීමයි!

**වජිරඥාණ නායක ස්වාමීන්වහන්සේ**

ලන්ඩන් බෞද්ධ විහාරයේ විහාරාධිපතිව වැඩවිසූ
පූජ්‍ය ආචාර්‍ය මැදගම වජිරඥාණ නායක හිමියන්
අපවත්වී පස් වසරක්
පිරීම නිමිත්තෙන්
**ලන්ඩන් බෞද්ධ විහාරයේ දී**
**2011 දෙසැම්බර් 17 වෙනි ශනි දා**
දානමය පිංකමක් පැවැත්වේ.
උදේ 11.00 බුද්ධ පූජාව
11. 15 සාංඝික දානය
12. 30 සෙත් පිරිත්
සහ පුණ්‍යානුමෝදනා
1. 00 ගිහි අයට සංග්‍රහ



මෙම පිංකමට සුපින්වත්
ඔබ සැමගේ සහභාගිත්වය
අපේක්ෂා කෙරේ.

**වජිරඥාණ නාහිමියන්ට නිවන් සුව පතමු!**


# තිරයෙන් සමුගත් සදාහරිත පෙම්වතා

# දේව් ආනන්ද්

**අ**තිශය ජනප්‍රිය නළුවෙකු, චිත්‍රපට නිශ්පාදකයෙකු සහ අධ්‍යක්ෂකවරයෙකු ද වන දේව් ආනන්ද් පසුගිය සතියේ ලන්ඩනයේදී ඔහු නැවතී සිටි හෝටලයේදී දෙසැම්බර් 4 වනදා වැළඳුණු හෘදයා බාධයකින් මියගියේය. එවිට දේව් 88 වන වියේ පසුවිය. ඔහුගේ අවසන් කටයුතු 11 වන සෙනසුරාදා ලන්ඩනයේ පට්නි වේල් සුසාන භූමියේදී සිදු කරන ලදී. භෂ්මාවශේෂ ඔහුගේ බිරිඳ, දුව සහ පුතාද විසින් ඉන්දියාවට රැගෙන යනු ලබන බව මාධ්‍යයෙන් දැනුම් දී තිබුණි.

අද බොලිවුඩ් ලෙස හඳුන්වන එදා බොම්බායේ තැනූ රිදී තිරයේ වැටුණු කතාන්තර වලට හින්දි රසිකයින් තුළ බයස්කෝප් පිස්සුව හටගන්නට මුල් යුගයේ හේතුවූ නළු මුහුණු අතර දේව් ආනන්ද් ට විශේෂ මෙන්ම ප්‍රථම තැන හිමිවේ. ඔහුගේ කඩවසම් මුහුණ යෞවනියන් මුසපත් කළ කාන්දමක් වූයේය. තරුණයෝ ඔහුගේ හැසිරීම් හා ඉරියව් අනුකරණය කරන්නට වූහ. ඔහු මෙන් කොණ්ඩය පීරන්නට ඔව්හු පුරුදු වූහ. දේව් අඳින මාදිලියේ ඇඳුම් ද ඇන්දාහ.




දේව් ගයිඩ් චිත්‍රපටයේ වහිඩා රොහමාන් සමග

ඉන්දියානු සිනමාවේ ස්වර්ණමය යුගය යයි හැඳින්වෙන 50 සහ 60 දශක වලදී රාජ් කපූර් දිලීප්කුමාර් සහ දේව් අනන්ද යන ත්‍රී මූර්තිය බොක්ස් ඔෆිස් වාර්තා බිඳහෙළන්නට සමත් නලුවන් තිදෙනෙක් වශයෙන් බොම්බායේ නිශ්පාදකවරු හඳුනාගෙන සිටියහ. ඒ එක් එක්කෙනා රඟපාන කිසියම් චිත්‍රපටයක් වේනම් එය මුදල් ඉපයීම අතින් සාර්ථක වන බව ඔවුන්ගේ පිළිගැන්ම විය. ඒ අතරින් දේව්ගේ හැසිරීම් රටාව තරුණ පෙළ අතර වඩාත් සිත්ගත් බව පෙනිණ.

දේව් ඉපදුණේ එදා බෙදී නොතිබුණු ඉන්දියාව තුළ ගුර්දස්පූර් නම් පන්ජාබයට අයත් ප්‍රදේශයේය. ඔහුගේ පියා පිෂෝරිමල් ආනන්ද් නම් ප්‍රවීන නීතිඥවරයෙකි. දේව් ලාහෝර්හි උසස් පාසැලකට යවන ලදී. (අද ඒ පළාත් සියල්ල අයිති පකිස්ථානයටය.) ඉන් උපාධිධරයෙකු ලෙස සුදුසුකම් ලබූ දේව් කලක පටන් ආසාවෙන් සිටි දෙයක් එනම් ඉන්දීය නාවුක හමුදාවට බැඳෙන්නට තීරණය කළේය. එහෙත් ඔහු ඉන් අසමත් වුණි. ඒ නිසා දේව් සිය වැඩිමහල් සොහොයුරා වන චේතන් අනුගමනය කරමින් බොම්බායේ සිනමා කර්මාන්තය දෙසට යොමුවූයේය. අයියා සැබැවින්ම උදව් කළේ ය.

සොහොයුරා නිසා දේව් එකල බොම්බායේ සිනමාවට සම්බන්ධ දැවැන්තයින් හඳුනාගත්තේය. ඉක්මනින්ම ඔහු චිත්‍රපටයක ප්‍රධාන චරිතයට තේරුණි. 1946 දී තැනුණු **හම් ඒක් හයින්** ඔහු රඟපෑ ඒ ප්‍රථම චිත්‍රපටයයි.

චේතන් හා දේව් එකතුව **නවකේතන් ෆිල්ම්ස්** යනුවෙන් සමාගමක් පිහිටුවන ලදී. ඉන් නිශ්පාදනය කළ හැම චිත්‍රපටයක්ම පාහේ ජනප්‍රිය වූයේය. ටැක්සි ඩ්‍රයිවර් 1954, නව් දෝ ග්‍යාරහා 1957, කලාපානි 1958, කාලා බසාර් 1960, තෙරේ ඝර් කේ සාම්නේ 1963, මේ චිත්‍රපට ඔහු හින්දි සිනමාවේ පෙර මුණේ තබන්නට සමත් විය.



දේව් ගිය වසරේ ලන්ඩනයේදී

දේව් නළුවෙකු හා පැසුණු සිනමාකරුවෙකු ලෙස ජාත්‍යන්තර තලයට ඔසවා තබන්නට සමත් වූ චිත්‍රපටය නම් 1965 දී ඔහුගේ බාල සොයුරා විජය අධ්‍යක්ෂණය කළ ආර් කේ නාරායන්ගේ ජනප්‍රිය නවකතාවක් පසුබිම්කර ගත් **ගයිඩ්** චිත්‍රපටයයි. එහි දේව් ප්‍රධාන චරිතය වහිඩා රෙහෙමාන් සමග රඟපෑවේ ය. එය යුරෝපයේ බොහෝ රටවල ප්‍රදර්ශණය වූ අතර ඊට සම්මාන ද රැසක් හිමිවූයේ ය.

සිනමාවට අමතරව දේව් දේශපාලනයට ද සම්බන්ධ බව දන්නේ ටික දෙනෙකි. 1977 දී දේව් එවක අගමැති ඉන්දිරාට එරෙහිව පක්ෂයක් ද ගොඩ නැගුවේය. ඉන්දිරා ඉන්දියාවේ හදිසි නීතිය පැනවීම ඔහුගේ අමනාපයට හේතුවයි. පක්ෂයේ නම **ජාතික පක්ෂය**යි. ඔහු පුද්ගලිකව පැවසුවේ ඉන්දිරාට පාඩමක් උගන්වන්නට එය හැදූ බවයි. මේ කතා ආරංචි වූ විට එය ඉන්දිරාගේ සහ ඇයගේ පුතා සංජේගේ නොමනාපයට හේතු විය.

ඔහු නිතර කී දෙයක් නම් ඉන්දීය පාර්ලිමේන්තුව හෙවත් ලෝක් සභාවට යා යුත්තේ යම් යම් ක්ෂේත්‍රයන්හි සුදුසුකම් ලත් පුද්ගලයින් බවයි.

කෙසේවුව ද තම පක්ෂයද දියකර දමා දේශපාලනයෙන් ඈත් වුවද දේව් නිතර ජනතා සහායට දුවගියේ ය. ජලගැලීම් භූමිකම්පා සහ වෙනත් ව්‍යසන වලදී ඔහු ඔවුනට පිහිට වූයේය.

දේව් දේශපාලන පක්ෂයක් පිහිට වූවාට පසු ඉන්දිරා ඇතුළු ප්‍රධාන දේශපාලකයෝ ජනතාව අද්දා ගැන්මට තම රැස්වීම්වලට නළුනිළියන් ගෙනඑන්නට පටන්ගත්හ. එය දැන් මෝස්තරයක් බවට පෙරළී ඇත.

කල්පනා කර්ටික් නම් නිළිය හා විවාහව සිටින දේව්ට සුනිල් නම් පුතෙක් ද දේවීනා නම් දුවක්ද ඇත.



දහසක් යෞවනියන් මත්කළ ඒ මුහුණ

හැම කල්හිම පුවත්පත් මාධ්‍යය විසින් ඔහු හඳුන්වන ලද්දේ සදාහරිත පෙම්වතා හෙවත් හැමදාම යෞවනයා යන ඇමතුමෙනි. සැබැවින්ම ඔහුගේ මුහුණුවර සදා කල්හිම ඉන්දීය මතකයේ රැඳී පවතිනු නොඅනුමානය.

♦ **කීර්ති**